සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

17738

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/ இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1999 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 1999 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 1999

**ශුද්ධ ගණිතය II**
**தூய கணிதம் II**
**Pure Mathematics II**

| 05 | |
|---|---|
| S | II |

පැය තුනයි / மூன்று மணித்தியாலம் / Three hours

ප්‍රශ්න **හතකට** පමණක් පිළිතුරු සපයන්න.

---

1. $x=a,\ x+y=b$ සහ $-x+y+z=c$ සමීකරණ $AX=B$ ආකාරයට ලියූ විට ලැබෙන $A$ න්‍යාසය සොයන්න;

මෙහි $X = \begin{pmatrix} x \\ y \\ z \end{pmatrix}$ සහ $B = \begin{pmatrix} a \\ b \\ c \end{pmatrix}$ වේ.

$x, y, z$ සඳහා $a, b, c$ ඇසුරෙන් දී ඇති සමීකරණ විසඳීමෙන්, $A^{-1}$ න්‍යාසය ලියන්න.

$C = \begin{pmatrix} 1 & 2 & 2 \\ -2 & -1 & 2 \\ 2 & -2 & 1 \end{pmatrix}$ නම්, $CC^T$ සොයන්න.

ඒ නයින්, $D = \begin{pmatrix} 1 \\ 1 \\ 1 \end{pmatrix}$ විට, $AC^T X = D$ සමීකරණය විසඳන්න.

$D = \begin{pmatrix} 0 \\ 0 \\ 0 \end{pmatrix}$ නම්, $AC^T X = D$ සමීකරණයට අනන්‍ය විසඳුමක් තිබේ ද?

ඔබේ පිළිතුර සනාථ කරන්න.

2. (අ) $x=0$ යන්න,

$$\begin{vmatrix} 4 & -1 & x-1 \\ x+2 & 1 & 1 \\ 4 & x-4 & 2x-4 \end{vmatrix} = 0$$

සමීකරණයෙහි විසඳුමක් බව සත්‍යාපනය කරන්න.
තව ද, ඉහත සමීකරණයේ ඉතිරි විසඳුම් සියල්ල ද සොයන්න.

(ආ) $f(x) = 2\cos^2 x + \sqrt{3}\sin x\cos x + \sin^2 x + 3,\ x \in \mathbb{R}$ යැයි ගනිමු.

$f(x) = r\cos(nx-\theta) + s$ ආකාරයට $f(x)$ ප්‍රකාශ කළ හැකි බව පෙන්වන්න ; මෙහි $n$ යනු ධන නිඛිලයක් ද, $r$ ධන සංඛ්‍යාවක් ද, $\theta, s$ තාත්ත්වික සංඛ්‍යා ද වන අතර $\theta \in \left[0, \frac{\pi}{2}\right]$ වේ.

$f$ හි උපරිම සහ අවම අගයයන් ද ඒවා සිදුවන විට අනුරූප $x$ හි අගයයන් ද අපෝහනය කරන්න.

[ අනෙක් පිට බලන්න.

3. ධන නිඛිලමය දර්ශකයක් සඳහා, ද මුවාවර් ප්‍රමේයය ප්‍රකාශ කර සාධනය කරන්න.

$n \in \mathbb{Z}$ සඳහා, $\theta \neq (4n+3)\frac{\pi}{2}$ විට,

$$\frac{1 + \sin\theta + i\cos\theta}{1 + \sin\theta - i\cos\theta} = \sin\theta + i\cos\theta$$

බව සාධනය කරන්න.

ඒ නයින් හෝ අන්ක්‍රමයකින් හෝ,

(i) $\left(1 + \sin\frac{\pi}{5} + i\cos\frac{\pi}{5}\right)^5 + i\left(1 + \sin\frac{\pi}{5} - i\cos\frac{\pi}{5}\right)^5 = 0$

බව පෙන්වන්න.

(ii) $\left(\frac{\sqrt{2} + 1 + i}{\sqrt{2} + 1 - i}\right)^{1/4}$ හි සියලු ම අගයයන් $\cos\theta + i\sin\theta$ ආකාරයට ලබා ගන්න.

[මෙහි, $a^{\frac{1}{4}}$ යන්නෙන් අදහස් කෙරෙනුයේ $z^4 = a$ හි විසඳුමකි.]

4. $z$ සංකීර්ණ සංඛ්‍යාව, ආගන් රූ සටහනෙහි $P$ ලක්ෂ්‍යයෙන් නිරූපණය වේ. $O$ යනු මූල ලක්ෂ්‍යය ද, $w$ යනු දී ඇති සංකීර්ණ සංඛ්‍යාවක් ද යැයි ගනිමු. $O$ වටා $\phi$ කෝණයකින් වාමාවර්ත අතට $OP$ භ්‍රමණය කළ විට $P$ හි නව පිහිටීම $P'$ යැයි ගනිමු ; මෙහි $\phi = \operatorname{Arg} w$ වේ. $Q$ යනු, $OQ = |w|\, OP'$ වන පරිදි $OP'$ මත පිහිටි ලක්ෂ්‍යය නම් $Q$ මගින් $zw$ සංකීර්ණ සංඛ්‍යාව නිරූපණය කෙරෙන බව පෙන්වන්න.

$|z - a| = a$ වක්‍රය, මූල ලක්ෂ්‍යය හරහා යන බව ද එහි කේන්ද්‍රය $x$ අක්ෂය මත පිහිටන බව ද සත්‍යාපනය කරන්න ; මෙහි $a$ යනු ධන නියතයකි.

$|z - a| = a$ විට,

(i) $z \neq 0$ සඳහා, $z - 2a = i\, z \tan\theta$ බව ද,

(ii) $\operatorname{Re}\left(\frac{1}{z - 2a}\right)$, $z$ හි අගය මත රඳ නොපවතින බව ද

පෙන්වන්න ; මෙහි $\theta = \operatorname{Arg} z$ වේ.

5. $O$ මූල ලක්ෂ්‍යය අනුබද්ධයෙන් $A, B, C$ ලක්ෂ්‍යවල පිහිටුම් දෛශික පිළිවෙළින් $-3\mathbf{i} + 3\mathbf{j} + 3\mathbf{k}$, $3\mathbf{i} - \mathbf{j} + 4\mathbf{k}$ සහ $-\mathbf{i} + 4\mathbf{j} + \mathbf{k}$ වේ.

$ABC$ ත්‍රිකෝණයේ වර්ගඵලය ද $ABC$ තලයට ලම්බ වූ ඒකක දෛශිකයක් ද සොයන්න.

ඒ නයින් හෝ අන් ක්‍රමයකින් හෝ $O, A, B, C$ ලක්ෂ්‍ය ඒකතල නොවන බව පෙන්වන්න.

$H$ යනු, $O$ සිට $ABC$ තලයට ඇඳි ලම්බයේ අඩිය යැයි ගනිමු. $\overrightarrow{OH}$ ද $BD : DC$ අනුපාතය ද සොයන්න ; මෙහි $D$ යනු $AH$ සහ $BC$ හි ඡේදන ලක්ෂ්‍යය යි.

6. (අ) $\tan^{-1}\left(\frac{5}{12}\right) + \tan^{-1}\left(\frac{7}{17}\right) = \frac{\pi}{4}$ බව පෙන්වන්න.

(ආ) $\cos x + \cos 3x = \sin 2x + \sin 4x$ සමීකරණය විසඳන්න.

(ඇ) $\cos 3\theta \equiv \cos\theta\ (2\cos 2\theta - 1)$ බව පෙන්වන්න.

ඒ නයින්, $\alpha = \frac{2\pi}{41}$ විට,

$$(2\cos 11\alpha - 1)(2\cos 17\alpha - 1)(2\cos 31\alpha - 1)(2\cos 33\alpha - 1) = 1$$

බව පෙන්වන්න.

7. $H$ යනු, $AC$ ට $BH$ ලම්බ වන පරිදි ද, $AB$ ට $CH$ ලම්බ වන පරිදි ද $ABC$ තලයෙහි වූ ලක්ෂ්‍යය යි. $ABC$ තලයෙහි වූ සෘජු කෝණාස්‍රාකාර කාටීසියානු අක්ෂ කුලකයකට අනුබද්ධ ව, $A \equiv (\alpha, \beta)$ වේ; මෙහි $|\alpha| \neq 1$, $\beta \neq 0$ සහ $\alpha^2 + \beta^2 \neq 1$ වේ. $BH$ සහ $CH$ රේඛාවල සමීකරණ පිළිවෙළින්

$(\alpha - 1)x + \beta y + \alpha - 1 = 0$ සහ $(\alpha + 1)x + \beta y - (\alpha + 1) = 0$ වෙයි.

$B$ සහ $C$ හි ඛණ්ඩාංක නිර්ණය කර $AH$ සහ $BC$ ලම්බ බව සත්‍යාපනය කරන්න.

$ABC$ ත්‍රිකෝණයේ එක් එක් ශීර්ෂය හරහා, සම්මුඛ පාදයට සමාන්තර රේඛාවක් ඇඳිනු ලැබේ. මෙම රේඛා තුනෙන් $A'B'C'$ ත්‍රිකෝණය සෑදේ. $H$ ලක්ෂ්‍යය, $A'$, $B'$ සහ $C'$ ලක්ෂ්‍යවලින් සමදුරින් පිහිටන බව පෙන්වන්න.

8. $P(\cos\theta, \sin\theta)$ යනු $x^2 + y^2 = 1$ වෘත්තය මත පිහිටි විචල්‍ය ලක්ෂ්‍යයකි. $Q$ යනු $P$ හරහා වූ විෂ්කම්භයේ අනෙක් අන්තය යි. $A$ සහ $B$ යනු පිළිවෙළින් $(1, 0)$ සහ $(0, 1)$ ඛණ්ඩාංක සහිත ලක්ෂ්‍ය වේ. $AP$ සහ $BQ$ රේඛා $U$ හි දී ඡේදනය වේ නම්, $U$ හි ඛණ්ඩාංක,

$$(x - 1)\cos\frac{\theta}{2} + y\sin\frac{\theta}{2} = 0$$

සහ $$(1 + x - y)\cos\frac{\theta}{2} + (x + y - 1)\sin\frac{\theta}{2} = 0$$

සමීකරණ තෘප්ත කරන බව පෙන්වන්න.

$U$ ලක්ෂ්‍යය, $S$ අචල වෘත්තයක් මත පිහිටන බව අපෝහනය කර එහි සමීකරණය ලබාගන්න.

තව ද, $AQ$ සහ $BP$ හි ඡේදන ලක්ෂ්‍යය ද $S$ මත පිහිටන බව පෙන්වන්න.

9. අරය $a$ වූ ද කේන්ද්‍රයේ ධ්‍රැවක ඛණ්ඩාංක $(a, \alpha)$ වූ ද වෘත්තයක ධ්‍රැවක සමීකරණය සොයන්න.

අරයයන් පිළිවෙළින් 3 සහ 4 වූ $S_1, S_2$ වෘත්ත දෙකක් $O$ සහ $O'$ හි දී ප්‍රලම්භ ව ඡේදනය වේ. $S_1$ හි කේන්ද්‍රය $O$ ට යා කෙරෙන රේඛාවත් $OO'$ රේඛාවත් අතර සුළු කෝණය සොයන්න.

$OO'$ ආරම්භක රේඛාව ලෙස ද $O$ ධ්‍රැවය ලෙස ද ගෙන $S_1$ සහ $S_2$ හි ධ්‍රැවක සමීකරණ ලියන්න.

$O$ හරහා වූ විචල්‍ය රේඛාවක්, පිළිවෙළින් $P$ සහ $Q$ ලක්ෂ්‍යවල දී $S_1$ සහ $S_2$ නැවත ඡේදනය කරයි. $PQ$ හි මධ්‍ය ලක්ෂ්‍යය අචල වෘත්තයක් මත පිහිටන බව පෙන්වා, එහි කේන්ද්‍රයේ ධ්‍රැවක ඛණ්ඩාංක සොයන්න.

10. $PQ$ යනු, ශීර්ෂය $O$ වූ $y^2 = 4ax$ පරාවලයේ විචල්‍ය ජ්‍යායක් යැයි ගනිමු. $P\hat{O}Q$ කෝණය සෘජු කෝණයක් වන පරිදි වූ සියලු $PQ$ ජ්‍යායයන් ඒකලක්ෂ්‍ය බව සාධනය කරන්න.

ඉහත පරාවලයට එය මත පිහිටි $R$ විචල්‍ය ලක්ෂ්‍යයක දී ඇඳි ස්පර්ශකය, $xy = 1$ බහුවලය $S$ සහ $T$ හි දී ඡේදනය කරනු ලැබේ. $ST$ හි මධ්‍ය ලක්ෂ්‍යය අචල පරාවලයක් මත පිහිටන බව පෙන්වන්න.